මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/64** **2024.09.04**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21
## සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබා දීම

2024.09.21 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළව 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 110 වන වගන්තියේ (2023 අංක 21 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියේ සංශෝධිත) විධිවිධාන සේවා යෝජකයන්ගේ හා නියුක්තිකයන්ගේ දැන ගැනීම පිණිස මෙහි පහත දක්වනු ලැබේ.

"110 (1), තෝරා පත්කර ගැනීමකදී පෞද්ගලිකව ඡන්දය දීමට හිමිකම් ඇති යම් තැනැත්තෙකුගේ සේවා යෝජකයෙකු වූ වෙනත් යම් තැනැත්තෙකු විසින්, ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් කරන ඉල්ලීමක් අනුව ඒ තෝරා පත්කර ගැනීමේදී ඒ තැනැත්තාට පෞද්ගලිකව ඡන්දය දීමට හැකි වන සේ ප්‍රමාණවත් යයි ඒ වෙනත් තැනැත්තා විසින් සලකනු ලැබිය හැකි (පැය හතරකට නොඅඩු) අඛණ්ඩ කාලයක් සඳහා වැටුප් අඩු නොවන පරිදි ලියවිල්ලකින් වූ නිවාඩු දෙනු ලැබිය යුතුය.

(1 අ) සෑම සේවා යෝජකයෙකු විසින්ම

(අ) (1) වන උපවගන්තිය යටතේ නිවාඩු සඳහා ඉල්ලුම් කරන තැනැත්තන්ගේ නම්; සහ
(ආ) ඒ උප වගන්තිය යටතේ නිවාඩු ප්‍රදානය කරනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ඒ තැනැත්තන්ට ඒ නිවාඩු ප්‍රදානය කරනු ලැබූ කාල සීමාවන්
දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කළ යුතු අතර, ඒ ප්‍රකාශය සේවා නියුක්ති ස්ථානයෙහි ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතුය.

(2) (1) වැනි උප වගන්තියේ හෝ (1 අ) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකට පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට හෝ මාසයක් නොඉක්මවන කාලයකට, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. "

02. ඉහත සඳහන් වගන්තියේ විධිවිධාන ප්‍රකාර ස්වකීය ඡන්දය දීමේ කාර්යය සඳහා නිවාඩු දෙන ලෙස ලියවිල්ලකින් ඉල්ලා සිටින සෑම සේවා නියුක්තිකයෙකුටම නිවාඩු ලබාදිය යුතුය. එසේ දෙනු ලබන නිවාඩු කාල සීමාව, අනියම් සේවා නියුක්තිකයන්ද ඇතුළුව සියලුම සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් වැටුප් සහිත වන විශේෂ නිවාඩුවක් ලෙස සැලකිය යුතු අතර, එය සේවා නියුක්තිකයන්ගේ සාමාන්‍ය නිවාඩු හිමිකමෙන් පිටස්තර විය යුතුය.

03. සේවා නියුක්තිකයෙකුට මෙම කාර්යය සඳහා දෙනු ලබන නිවාඩු කාල සීමාව, එම සේවා නියුක්තිකයාගේ කාර්ය ස්ථානයේ සහ ඡන්ද පොළ අතර ඇති දුර ප්‍රමාණය මත සේවා යෝජකයා විසින් නිගමනය කළ යුතුය.

04. නීතිය අනුව නිවාඩු ලබා ගැනීම පිළිබඳව මෙයට පෙර පැවති ඡන්ද විමසීම්වලදී සේවා නියුක්තිකයින්ගෙන් පැමිණිලි ලැබී ඇති හෙයින් මෙම ඡන්ද විමසීමේදී ඡන්දය දීමට හිමිකම් ඇති ස්වකීය සේවා නියුක්තිකයන්ට, නිත්‍යානුකූලව හිමිවන එම නිවාඩුව ලබාදෙන ලෙස රාජ්‍ය හා පෞද්ගලික යන දෙපාර්ශවයේ සියලුම සේවා යෝජකයන්ගෙන් ඉල්ලා සිටිමි.

05. ඉහත සඳහන් ජනාධිපතිවරයා තෝරා පත්කරගැනීමේ ඡන්ද විමසීම, 2024 සැප්තැම්බර් මස 21 වන සෙනසුරාදා දින පෙ.ව.7.00 සිට පස්වරු 4.00 දක්වා පැවැත්වේ.

06. මේ සම්බන්ධයෙන් සියලුම සේවායෝජකයන්ගෙන් ලැබෙන සහයෝගය පිළිබඳව අතිශයින් කෘතඥ වෙමි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්